# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2350/15 - 2023 සැප්තැම්බර් මස 18 වැනි සඳුදා - 2023.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: RUW/LAN/ACQTN/A2/258.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/18/2019/WS/599.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*මහජන කටයුත්ත කුමක්ද යන වග.-* රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ බස්නාගොඩ ජලාශය නිසා බලපෑමට ලක්වන රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පවුල් 07ක් නැවත පදිංචි කරවීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම - මාගල්කන්ද

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 101 වහරක ග්‍රාම නිලධාරි වසමේ, වහරක ගමේ සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරු අංක 3847 හා 2022.05.30 දිනැති පිඹුරේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.0355ක් වූ පහත සඳහන් බිම් කැබලි :

01. කැබලි අංක 01
ඉඩමේ නම : මාගල්කන්ද වත්ත; මුල් හිමිකම් පාන්නා : මල්වත්ත වැලි වැව්ලි සමාගම, අංක 280, වේල්ල වීදිය, කොළඹ 12; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0139

02. කැබලි අංක 02
ඉඩමේ නම : -; මුල් හිමිකම් පාන්නා : මල්වත්ත වැලි වැව්ලි සමාගම, අංක 280, වේල්ල වීදිය, කොළඹ 12; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0128

03. කැබලි අංක 03
ඉඩමේ නම : -; මුල් හිමිකම් පාන්නා : මල්වත්ත වැලි වැව්ලි සමාගම, අංක 280, වේල්ල වීදිය, කොළඹ 12; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0660

04. කැබලි අංක 04
ඉඩමේ නම : මාගල්කන්ද වත්ත; මුල් හිමිකම් පාන්නා : මල්වත්ත වැලි වැව්ලි සමාගම, අංක 280, වේල්ල වීදිය, කොළඹ 12; ප්‍රමාණය: හෙක්ටයාර් 0.9428

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023 නොවැම්බර් මස 29 වැනි දින පෙ.ව. 10.00ට රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2023.11.22 දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල් ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි. අයිතිවාසිකම් ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ඔප්පු හා වෙනත් ලියවිලි පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතු ය.

එච්. ඩී. එස්. එන්. හෙට්ටිගේ,
ප්‍රාදේශීය ලේකම්,
රුවන්වැල්ල.

2023 සැප්තැම්බර් මස 15 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0141

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : 2020/07 සහ අනු/02/05/යාන් ඔය.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/9/2018/IR/277.

අංක 2236/39 සහ 2021.07.14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය යටතේ ප්‍රකාශයෙහි 7A පිටුවෙහි සිංහල භාෂාවෙන් පළ කරන ලද දැන්වීමෙහි අනු අංක 09 යටතේ වන ඉඩම් කැබලි අංක 1971 හි "ප්‍රමාණය හෙක්ටයාර් 0.0893" යන්න "ප්‍රමාණය හෙක්ටයාර් 0.4852" ලෙස නිවැරදි විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ටී. වී. කේ. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
කැබිතිගොල්ලෑව.

2023 අගෝස්තු මස 28 වැනි දින,
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0142

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : THI/LND/L2/ACQVI/119.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/9/2014/WS/02.

තිහගොඩ ප්‍රාදේශීය ලේකම් දුමින්ගු හේවාගේ උදයාන්ගනී සඳමාලි වන මම, මාතර IV වන අදියර ජල යෝජනා ක්‍රම යටතේ ගල්කැටිය භූගත ජලාශය හා ස්ථාන භාරකරු නිල නිවාසය ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම ව්‍යාපෘතිය සඳහා ඉඩම් අත්කර ගැනීමට අදාළව නිකුත් කරන ලද 2021.04.06 දිනැති අංක 2222/30 හා 2021.10.12 දිනැති අංක 2249/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* ප්‍රකාශයට පත් කරන ලද 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වන වගන්තිය යටතේ *ගැසට්* නිවේදනයේ ශුද්ධි පත්‍රිකාව හිමිකම් පරීක්ෂණ දිනය 2023.09.23 දින ලෙස ද, ඊට අදාළ ලියකියවිලි ඉදිරිපත් කළ යුතු දිනය 2023.09.20 දින ලෙස ද, හා අත්කර ගන්නා ඉඩමට අදාළ මූලික පිඹුරු අංකය 2909 ලෙස ද, ඉඩම් කැබලි අංක 01 හා 02 ලෙස ද ඉඩම් කැබලි අංක 01හි බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.1260ක් ලෙස ද ඉඩම් කැබලි අංක 02හි බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.0113ක් ලෙස ද සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඩී. එච්. යූ. සඳමාලි,
ප්‍රාදේශීය ලේකම්/ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2023 සැප්තැම්බර් මස 11 වැනි දින,
තිහගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0143

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.